# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.17 පැය 2235 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 764 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**උතුරු පළාත් අපරාධ කොට්ඨාසය විවෘත කිරීම - පොලිස් මූලස්ථානය.**

ශ්‍රී ලංකා පොලිසියේ පරිපාලන ව්‍යුහය ප්‍රතිසංවිධානය කිරීමට සමගාමීව කන්කසන්තුරය පොලිස් වසමේ පිහිටි උතුරු පළාත් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති කාර්යාල භූමියේ ගොඩනැගිල්ලක් තුල විවෘත කරන ලද **“උතුරු පළාත් අපරාධ කොට්ඨාසය”** 2025.04.17 වන අද දින වැඩබලන පොලිස්පති නීතිඥ ප්‍රියන්ත වීරසූරිය මහතා විසින් විවෘත කරන ලදී.

ඒ අනුව, උතුරු පළාතේ වව්නියාව, මන්නාරම, කිලිනොච්චිය, මුලතිව්, යාපනය සහ කන්කසන්තුරය යන කොට්ඨාස වලට අයත් පොලිස් වසම් 61ක් ආවරණය වන පරිදි සංවිධානාත්මක අපරාධ සහ අපරාධ කල්ලි මර්දනය කිරීම මෙන්ම මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාලය අකර්මණ්‍ය කරමින් මත්ද්‍රව්‍ය ජාවාරම මර්දනය කිරීමද මෙම උතුරු පළාත් අපරාධ කොට්ඨාසය ස්ථාපිත කිරීමේ අපේක්ෂිත කාර්යභාරයයි.

මෙම අවස්ථාව සඳහා උතුරු පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තිලක් සී.ඒ. ධනපාල, යාපනය දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති කාලිංග ජයසිංහ, කන්කසන්තුරය කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රවින්ද්‍ර අඹේපිටිය, යාපනය කොට්ඨාසය භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි සුනිල් ජයමහ මහතා ඇතුළු උසස් නිලධාරීන් රැසක්ද සහභාගි විය.

මෙම අවස්ථාවට අදාල ඡායාරූප කිහිපයක් හා වීඩියෝ පටයක් මේ සමග ඔබ වෙත යොමු කරමි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**